# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1997/23 - 2016 දෙසැම්බර් මස 15 වැනි බ්‍රහස්පතින්දා - 2016.12.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ඒ. ව්‍යවස්ථාවේ (4) වන ඡේදය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාර ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සාදන ලද රීති.

එස්. ටී. හෙට්ටිගේ,
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2016 ඔක්තෝබර් මස 27 වැනි දින,
කොළඹ දී ය.

රීති

01. මෙම රීති, ජාතික පොලිස් කොමිෂන් සභා (අභියාචනා කාර්ය පටිපාටික) රීති 2016 යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 155 ඌ. සහ 155 ඒ. ව්‍යවස්ථා යටතේ පත්කරනලද කමිටුවක් විසින් හෝ පොලිස්පතිවරයා විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ කරනු ලැබූ උසස්කිරීමක්, ස්ථානමාරු කිරීමක්, විනය කාරණයක් නිසා කරනු ලැබූ යම් නියෝගයක් හෝ සේවයෙන් පහ කිරීමක් සම්බන්ධයෙන් කරනු ලැබූ යම් නියෝගයක් හේතුකොට ගෙන අතෘප්තියට පත්වන යම් පොලිස් නිලධාරියෙකුට ඔහු/ඇය සම්බන්ධයෙන් එවැනි නියෝගයකට එරෙහිව ලිඛිත අභියාචනයක් මෙම රීති යටතේ ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැකිය.

03. කොමිෂන් සභාව වෙත කළ හැක්කේ එක් අභියාචනයක් පමණි.

04. සෑම අභියාචනයක්ම කොමිෂන් සභාවේ ලේකම්වරයා අමතා ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යාලයට අතින් ගෙනවිත් භාරදිය යුතු ය. අභියාචනය ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගත යුතු ය.

05. (අ) අදාළ පරිදි කමිටුව හෝ පොලිස්පතිවරයා හෝ පොලිස් නිලධාරියෙකු විසින් කරනු ලැබූ නියෝගය නිසා අතෘප්තියට පත් පාර්ශ්වය විසින් එකී නියෝගය ලද දිනයේ සිට මාස හයක (06) ක කාලයක් තුළ සෑම අභියාචනයක්ම ඉදිරිපත් කළ යුතු ය.

(ආ) අභියාචනයක් ඉදිරිපත් කිරීමට මාස හයක කාලයක් ඉක්මවා ගත වුවද, හුදෙක් එකී අභියාචනයේ ඉදිරිපත් කර ඇති කරුණුවල සාධාරණත්වය සහ සිද්ධිවලට බලපෑ හේතු සහ අවස්ථාවන් සලකා බලා ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් යම් අභියාචනයක් පිළිගැනීම සලකා බැලිය හැකිය. එබඳු අවස්ථාවකදී, නියමිත මාස හයක කාල සීමාව තුළ අභියාචනය ඉදිරිපත් කර නැත යන කරුණ කොමිෂන් සභාව විශේෂයෙන් සඳහන් කළ යුතු වන අතර එකී අභියාචනයේ ඇති සුවිශේෂ කරුණු පදනම් කරගෙන පමණක් එකී අභියාචනය සලකාබලන ලද බවද සඳහන් කළ යුතු ය.

06. (අ) අභියාචනයක් විභාගයට ගත් අවස්ථාවේ දී,

I. අවස්ථාවෝචිත පරිදි පොලිස්පතිවරයාගෙන් හෝ පොලිස් නිලධාරියෙකුගෙන් වාර්තා, ලිපිගොනු හෝ අදාළ වෙනත් ලිපි ලේඛන කැඳවීම සහ

II. අභියාචක කැඳවීමට කොමිෂන් සභාවට හැකිය.

මෙම ඡේදය යටතේ ගොනු සහ අනෙකුත් අදාළ ලිපි කැඳවා ඇති විට එබඳු ඉල්ලීමක් ලද දිනයේ සිට මාසයක් නොඉක්මවන ලද කාලසීමාවක් තුළ ඊට අනුකූලතාවය දක්වීම අවස්ථාවෝචිත පරිදි පොලිස්පතිවරයාගේ හෝ පොලිස් නිලධාරියාගේ රාජකාරිය වන්නේ ය.

07. ඉහත විශේෂකොට දක්වන රීතිවලට අනුව ගොනුකර නොමැති අභියාචනයක් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බාරගනු නොලබන්නේ ය.

08. යම් අභියාචනයක් පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය, එම තීරණය ගත් දින සිට දින තිහක් ඇතුළත අභියාචකයාට/අතෘප්තියට පත් නිලධාරියා වෙත ලිඛිතව දැන්විය යුතු ය.

09. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති ''ජාතික පොලිස් කොමිෂන් සභාව'', ''කොමිසම'' වශයෙන් මෙහිදී අදහස් වන්නේ ය.

10. 2007 අප්‍රේල් 30 වන සඳුදා දින අංක 1495/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කළ 2007 ජාතික පොලිස් කොමිෂන් සභාවේ අභියාචනා කාර්ය පටිපාටික රීති මෙයින් අවලංගු වන්නේ ය.

12 - 1177

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.